මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: (+94)-11-2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: CGO/ASM/Policy/Cir/01
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.03. 27

**වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 01/2018**

සියලුම: අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
රාජ්‍ය බැංකු හා රාජ්‍ය සමාගම් සභාපතිවරුන්,

**<u>රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය - ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන අපහරණය කිරීම.</u>**

2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 අනුව වාර්තා කළ යුතු වූ පරිදි රාජ්‍ය ආයතන විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කරන ලද මෝටර් වාහන පිළිබඳ තොරතුරු සලකා බලමින්, ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන 7,723ක් අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට අදාළ අමාත්‍යාංශ හා ආයතන වලට උපදෙස් ලබාදෙන ලෙසට 2018 ජනවාරි 02 පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02) ඒ අනුව, රජයේ ආයතන සතු මෝටර් වාහන අපහරණය කිරීම සඳහා 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 මඟින් උපදෙස් ලබා දී තිබියදීත්, ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන 7,723ක ප්‍රමාණයක් පැවතීම අසතුටුදායක තත්ත්වයක් බව අවධාරණය කරන අතර, පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙසට සියලුම රාජ්‍ය ආයතන වල ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

අ) 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 මඟින් ලබා දී ඇති උපදෙස් අනුගමනය කරමින් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින සියලුම වාහන 2018 ජූනි 30 දිනට පෙර අපහරණය කිරීම.

ආ) අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක සතු එවැනි මෝටර් වාහන අපහරණය කිරීමෙන් ලැබෙන සියලුම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම. අයවැය ප්‍රතිපාදන මඟින් මුදල් සපයනු ලබන රජයේ අනෙකුත් සියලුම ආයතන වල එවැනි ලැබීම් ද, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වේ.

ඇ) ඉහත සඳහන් අපහරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසු අදාළ යාවත්කාලීන කරන ලද තොරතුරු 2018 ජූලි 30 දින හෝ ඊට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත් කිරීම.

03) රජයේ වත්කම් කළමනාකරණය කිරීම ප්‍රමුඛ කාර්යයක් වන බැවින්, ඉහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන ලෙස සියලුම රාජ්‍ය ආයතන වෙත කාරුණිකව දන්වමි.මේ පිළිබඳ යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයෙන් විමසිය හැකි වේ.


කොම්ප්ට්‍රොලර් ජනරාල්,
කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

දුරකථන අංකය : 011 - 2151425
ෆැක්ස් අංකය : 011 - 2151417


**ආර්.එච්.එස්.සමරතුංග**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
2. විගණකාධිපති
3. අධ්‍යක්ෂ ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: CGO/ASM/Policy/Cir/01
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 19 03.2018

**Assets Management Circular No 01/2018**

To all: Secretaries of Ministries,
Chief Secretaries of Provincial Councils,
Heads of Departments,
Heads of Public Corporations and Statutory Boards,
Chairmen of State Banks and Government owned Companies,

**Non-financial Assets Management of the Government - Disposal of Motor Vehicles not in running condition**

The Cabinet of Ministers at its meeting held on 02nd January 2018, considering the information on motor vehicles submitted to the Comptroller General's Office by the Government agencies as required to be reported under the Assets Management Circular No 01/2017 dated 28th June 2017, has decided to instruct the respective ministries and institutions to take actions to dispose 7,723 number of motor vehicles not in running condition.

02. Accordingly, while stressing that accumulation of a stock of 7,723 number of motor vehicles not in running condition is an unsatisfactory situation despite the instructions given by Public Finance Circular No 02/2015 dated 10th July 2015 for disposal of motor vehicles owned by Government agencies, all Heads of Government Agencies are requested to take necessary actions as given below;

a) Dispose all motor vehicles not in running condition before 30th June 2018, following the instructions given in Public Finance Circular No 02/2015 dated 10th July 2015.

b) Credit all the proceeds received from the disposal of such motor vehicles owned by the Ministries, Departments and Special Spending Units to the Consolidated Fund. Such proceeds of all other Government Agencies funded by the budgetary provisions should also be remitted to the Consolidated Fund.

c) Submit updated information to Comptroller General's Office on or before 30th July 2018, after completion of above disposal process.

03) As the management of public assets is a high priority activity, all the Government Agencies are kindly requested to adhere to above instructions. For further clarifications, please contact the Comptroller General's Office.

Comptroller General,
Comptroller General's Office,
Ministry of Finance and Mass Media,
The Secretariat,
Colombo 01.

Tel: 011 - 2151425
Fax: 011 – 2151417

**R.H.S.Samaratunga**
**Secretary to the Treasury**

Copies:

1. Secretary to the Cabinet of Ministers
2. Auditor General
3. Commissioner General of Motor Traffic